# කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය
# අගයදාම සංවර්ධන සංරචකය

## උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම

ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් සපයන ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතියේ පහත සඳහන් කාර්යාලවල ඇති පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහ පළපුරුද්ද ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැඩසටහන් සහකාර - තනතුරු 02**
**(බත්තරමුල්ල සහ වව්නියාව)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය, මුදල්, කෘෂිකර්ම, වාණිජ හෝ බැංකුකරණය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

**හෝ**

2. ඉහත සඳහන් අදාළ ක්ෂේත්‍රයක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්ද.

අයදුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට වයස් සීමාව අවුරුදු 24 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමය :**

සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන් තෝරා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

**වැටුප :**

2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2019 අනුව වේ

**වෙනත් කොන්දේසි :**

අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ආ) හොඳ චරිතයකින් හා යහපත් ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
ඇ) ඉංග්‍රීසියෙන් (වාචික හා ලිඛිත) සන්නිවේදන කුසලතා තිබීම වඩාත් යෝග්‍ය වේ.
ඇ) ඉහළ පරිගණක සාක්ෂරතාවක් තිබීම යෝග්‍ය වේ.
ඉ) විශේෂයෙන් වව්නියාව දිස්ත්‍රික්කයේ සහ ලංකාවේ වෙනත් ඕනෑම ප්‍රදේශයක වැඩ කිරීමට කැමැත්ත.

**රැකියා නියුක්තිය සඳහා කොන්දේසි :**

අ) මුලින් කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා පත් කිරීම සිදු කෙරෙන අතර, ව්‍යාපෘතියේ කාල සීමාව සහ සේවකයාගේ කාර්යය සාධනය මත සේවා කාලය දීර්ඝ කෙරේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම**

සියලුම අයදුම්කරුවන් විසින් අදාළ වන සියලු සහතිකපත්වල පිටපත් හා තම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම, ලිපිනයන් සහ දුරකථන අංකද සමග 24.09.2021 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පණිවිඩ සේවා සපයන ආයතනයක් මගින් ලැබෙන පරිදි එවිය යුතුය.

දැනට රජයේ/අර්ධ රාජ්‍ය සේවාවන්හි සිටින අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**ලේකම්**
**උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**
**16 වන මහල**
**සුහුරුපාය, බත්තරමුල්ල**
**09.09.2021**